# ඇස්ගෙඩි දෙකට හෙණ ගහලද සිහලුන්ගේ

මෙවර හදිසි නීති විවාදයත් අවසන් වුණේ විරුද්ධ පක්ෂය හැටියට මූලික වශයෙන් දෙමළ මන්ත්‍රීවරු පමණක් ඉතිරි කරලා. ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙන්න හිටියේ 17 දෙනයි.

හදිසි නීතිය පවත්වාගෙන යාම බරපතල ප්‍රශ්නයක් හැටියට විරුද්ධ පක්ෂය දකින්නේ නැති එක ලොකු ප්‍රශ්නයක්. මේ රට තුළ දන් ප්‍රජාතන්ත්‍රවාදය ඇහිරී යාමට විශාලම හේතුව වෙලා තියෙන්නේ හදිසි නිතියයි.

එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් රට පුරා කියාගෙන යන්නේ තමන්ට ඡන්දය කරන්න වත් නිදහසක් දුන්නේ නෑ කියලයි. ආණ්ඩුව මේ ඒකාධිපති බලය ක්‍රියාත්මක කරන්නේ හදිසි නීති පිටුබලයත් ඇතිවයි.

පොලීසි, හමුදාවලට ඉහළින් එන අණට කීකරු වෙලා, සාමාන්‍ය නීතියට පිටුපාලා වැඩ කරන්නට සිදු වෙලා තියෙන්නේ මේ හදිසි නීතිය ක්‍රියාත්මක වීමෙන්. අපි මේ ගැන කියන හැම වේලේම මේ පක්ෂ දෙකේම උදවියත් ඒකට හූමිටි තියනවා. ඒත් මේ ප්‍රශ්නය තදින් අරන් පාර්ලිමේන්තුවේ ලොකු සටනක් කරන්න මේ අයට උවමනාවක් නෑ.

ජනාධිපතිගේ ආධාරයෙන් ආරක්ෂා වෙලා ජනාධිපති පලවා හැරීමට වැඩ කරන විපක්ෂයක් ගැන හිතන කොටත් හිනා යනවා. ඇත්තටම මහින්දත් හිතනවා ඇති මේ විරුද්ධ පක්ෂය ඉන්න කම් තමන්ගේ පාලනයට අවුලක් නෑ කියලා.

ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් බල මෙහෙයුම් කරල දෙමළ බලාපොරොත්තු සුන් කිරීම ගැන මේ අය අතර තියෙන්නේ ලොකු සමානත්වයක්.

ඇත්තටම මේ විදියට එකඟ නම් ඇයි ටිල්වින්ලා, සෝමවංශලා ආණ්ඩුවෙන් ඉවත් වුණේ. ඒ අනුව විමල් කියන දේත් පිළිගන්න වෙනවා. දෙගොල්ලොම එකට ඉන්න කොට ඇති කරගත් දේශපාලන දක්ම අනුව නිවැරදි තැන ඉන්නේ තමන් කියලයි විමල් හැම විටම කියන්නේ.

ඇත්තටම ටිල්වින්ලා ලොකුවට එළියට ආවත් තවමත් ආණ්ඩුවේ ජාතිවාදී යුදවාදී ගමනට මූලිකව එකඟව එය ආරක්ෂා කරන තැනයි මේ අයත් ඉන්නේ. ඒ නිසා තමයි හදිසි නීතියට විරුද්ධව පාර්ලිමේන්තු මෙහෙයුමක්වත් කරන්න අකමැති.

ආණ්ඩුවෙන් මොන බැට කෑවත් ලොකු අභියෝගයක් හදිසි නීතියට මේ අය කරන්නේ නැහැ. ඒකට හේතුව ජාතිවාදී රාජ්‍ය පදනම රැකගැනීමට තමන් යටි හිතින් දිවුරලා පොරොන්දු වීමයි.

යූඇන්පීය නම් කොහොමටත් කලබල ඇතිකරන පක්ෂයක් නෙවෙයිනේ. ජනතා අරගල කියල දෙයක් රනිල්ගේ පොත්වල නෑ. ලක්තිලකලා කියන විදියට ඇස්වාට්ටුවෙන් පටන් ගත් යූඇන්පී පෙළපාලිය පුංචි බොරැල්ලෙන් නවත්වලා ලොක්කා ගෙදර ගියාලු.

පොඩ්ඩක්වත් ජනතාව ගැටුමකට යොමු කරන්නට බැරි විපක්ෂයකට රාජ්‍ය මර්දනයට විරුද්ධව පෙනී හිටින්න පුළුවන්ද? ප්‍රේමදාස රැල්ලත් නිකම්ම පුස්ස බින්ද වගේ ගැස්සලා ගියා. සජිත් හොඳ බබා වගේ ලොක්කට තුරුල් වෙලා ඉන්නවා, කාලේ එනකම් බලා ඉන්නවා වගේ.

මිනිහා බලා ඉන්න අතර රනිල්ගේ බෑනා, විජේවර්ධන මන්ත්‍රීතුමා ක්‍රමයෙන් මුහුකුරා ඒවි. එතකොට ප්‍රේමේගේ යුගය ගැන කියල පක්ෂය තුළ කෙළින් ඉන්න බැරි වේවි. එතකොට ආණ්ඩුවේම බංකොළොත් කම උඩ තමන්ගේ ඔඩොක්කුවට රාජ්‍ය බලය වැටෙනකම්ම රනිල් බලා ඉඳියි.

ඇමරිකාව, ඉන්දියාව, චීනය වගේ රටවල්වල ලොක්කෝ තීන්දු කරල, සිංහාසනයට අඩ ගහන කම්ම රනිල් බලා ඉන්න නිසා සෑහෙන කලක් වැඩේ දිග්ගැහෙන්න පුළුවන්.

හැබැයි විපක්ෂයේ බ්‍රේක්වලින් ජනතාව එක්තැන් කරගෙන ඉන්න වැඩපිළිවෙලට වැඩි ආයුෂ නෑ. එක පැත්තකින් බලය බෙදීම ගැන දෙමළ ජනතා ඉල්ලීම උඩ දෝස්මුරේ මහින්දගේ ඇඟට කඩා වැටෙන්න පුළුවන්. අනෙක් අතට පීඩිත ජනතා නැගිටීම දකුණෙන් නැගල එන්න ඉඩකඩ තියෙනවා.

පසුගිය සති කිහිපය තුළම විවිධ ජනකොටස්වල වෛරය පුපුරාගෙන එන හැටි අපට පෙනුනා. තැපැල් කම්කරුවෝ ගැටුමේ ඉඳගෙනම සැලසුම් දමනවා. දුම්රියේ ඉන්න විවිධ කොටස් වෙන් වෙන් වශයෙන් සටන් පටන් අරන්.

විශ්‍රාම වැටුප් ගිනිකෙළියට විරුද්ධවත් රාජ්‍ය අංශය ඇවිස්සෙන්න පුළුවන්. සිසුන්ගේ අරගලවලට නම් ආණ්ඩුව තුට්ටු බාගයකටවත් මායිම් කරන්නේ නෑ.

SB ඉතාම තදින් කියන්නේ "දෙන විදියටම කාපල්ලා. නැත්නම් පලයල්ලා" කියන එකයි. රජය ගෙනියන ඉහළ අධ්‍යාපනය මුළුමණින්ම අකුළන්න වුණත් ලැස්ති විදියට කථා කරනකොට සිසුන්ට පරිස්සම් වෙන්න වෙනවා. මොකද? සිසුන්ගේ අරගලය පතින රිලවුන්ට ඉනිමං බැඳීමක් වෙන්න පුළුවන් නිසා.

මහින්දට දැන් තියෙන තවත් කරදරයක් තමා සෝනියා රැජින, ඇමරිකාවේ බ්ලේක් බලවතා සමඟ එකතු වෙලා කරන බලපෑම. සෝනියා රැජිනත් දැන් කියන්නේ මහින්ද මානව හිමිකම් විනාශ කරල කියලයි.

චම්පික ඇමති කියල තිබුණ සෝනියා ලංකාව ෆුට් බෝලයක් හැටියට යොදා ගන්නවා කියල. මුන්දැලාට දැන් තමා මතක් වෙලා තියෙන්නේ සෝනියා මේ ගොල්ලන්ව වහල් රජයක් ලෙසට සලකන බව.

එදා මේ පරදේසක්කාරීන් කියන කියන විදියට නටනටා දෙමළුන්ට පහර දුන්න හැටි මතක් කළොත් හොඳයි. යැංකි මංකි හමුදාවල පිහිටාධාර සමඟ මේ අයගේ උදව්වෙන් දෙමළ කැරැල්ල මැඩීමට දරුණු සංහාරයක් කළේ. මතක නැද්ද?

පරදේසක්කරයෝ ඒවට උදව් කළේ මේ රට තමන්ට ෆුට් බෝලයක් කරගන්න තමයි. ඒකයි අපි කිව්වේ. එතකොට චම්පික උන්නැහේ අපිට කොටි ලේබල් අලවල රාජ්‍ය ත්‍රස්තවාදය එල්ල කළා. මාව මරන්න මැරවරයෝ එව්වා.

දැන් මුන්දලා සෝනියා මහ රැජිනගේ ෆුට්බෝලයක් බවට පත් වෙලා නම් අපට අඬන්නද, හිනා වෙන්නද කියල හිතන්න අමාරුයි. මේ රට වහල්භාවයෙන් මුදා ගන්නට නම් කරන්න ඕනෑ පළමු දෙය තමා මේ සෝනියාගේ, ඔබාමාගේ බත්බැලයන් බලයෙන් පහ කිරීම.

මේ පරදේසක්කාරයන්, ඒජන්තයන් කණෙන් අල්ලලා එළියට දාන්නේ නැතිව මේ රට ඇමරිකන්-ඉන්දියන් වහල් බැම්මෙන් මුදා ගන්නට බෑ.

මුන් පර බලවේග සමඟ එකතු වෙලා අපේ ජනතාව ඝාතනය කළා. අතුරුදහන් කළා. අනාථ කළා. ඊළඟට අපේ මහ පොළොව පර කොම්පැණිවලට කණු කොල්ලයට පූජා කළා. එයින් මුන්ගේ සාක්කු පුරවා ගත්තා. සල්ලි පර බැංකුවලට යැව්වා. අපේ ගංගා, ඇලදොළ, වෙරළ, මහ මුහුද පවා පර දේසක්කාරයින්ට පවරල දුන්නා. අපි අපේ දේශය තුළම සරණාගතයන් බවට පත් කළා.

දැන් බොරුවට සෝනියාගේ ෆුට්බෝල් ගැන රැවටිලි කථා කියනවා. මේ වෙලාවට තමා "මුන්ගේ කැවුතු කැවත් මදි" කියන ගැමි කථාව මතක් වෙන්නේ. ටිබෙට් හාමුදුරුවෝ කිව්වා" ඇස්ගෙඩි දෙකට හෙණ ගහලද සිහලුන්ගේ" කියල. ඒක හරියටම හරි ගියේ පහුගිය කාලය තුළම තමා.